# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2480/04 – 2026 මාර්තු මස 16 වැනි සඳුදා – 2026.03.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/180.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.07.09 දිනැති හා අංක 2183/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.12.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අඟුණකොලපැලැස්ස, මහවැලි කඳවුර, ටෙලිකොම් අසල, E1/A 12 හි පදිංචි එස්.ලියනගේ මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10. ටී.බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A32/2020 හා 2026.01.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 පෙබරවාරි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

නඩු අංකය - A/32/2020

ගොනු අංකය - IR/COM/05/2017/180

එස්.ලියනගේ මිය,
E 1/A 12,
ටෙලිකොම් අසල,
මහවැලි කඳවුර,
අඟුණකොළපැලැස්ස.

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
නො. 500,
ටී.බී. ජයා මාවත,
කොළඹ 10.

දෙවන පාර්ශ්වය

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453F, හි පදිංචි විතාරණගේ ජයරත්න වන මා වෙත 2020.03.11 දිනැතිව යොමුකර ඇත.

ආරාවුලට තුඩුදුන් කරුණු :

කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතාගේ IR/COM/05/2017/180 අංකයෙන් සහ 2019 දෙසැම්බර් මස 30 දිනැති යොමුව අනුව එකී කාර්මික ආරාවුලට හේතු කාරක කරුණු වනුයේ,

“ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරිනියක ලෙස සේවය කරන එස්.ලියනගේ මහත්මිය විසින් ලිපිකරු II ශ්‍රේණිය, ලිපිකරු I ශ්‍රේණිය පාලන සහකාර හා පරිපාලන නිලධාරි තනතුර පෙරදාතම කරන ලෙසත්, සහකාර අධ්‍යක්ෂක (පිරිස්) නියෝජ්‍ය අධ්‍යක්ෂක (පිරිස්), අධ්‍යක්ෂක (පිරිස්) යන තනතුරු සුදුසුකම් සලකා ලබාදෙන ලෙසත්, ඒ අනුව හිඟ වැටුප් හා අදාළ දීමනා ලබා දෙන ලෙසත් කරනු ලබන ඉල්ලීම සාධාරණ සහ යුක්ති සහගත වන්නේ ද? එසේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.” යනුවෙන් සඳහන් කර ඇත.

ඊට අදාළව පළමු පාර්ශ්වය වන එස්.ලියනගේ යන අය 2020 අගෝස්තු 4 දිනැතිව පිටු අංක 8-16 දක්වා සවිස්තර ප්‍රකාශය සමඟ A 7 සිට A 1 දක්වා ලේඛන (අග සිට මුලට) ගොනු කර ඇත. පිළිවෙලින් ඒවා පහත පරිදි වේ.
A 1 එච්.කේ. සෝමාවතී මෙනවිය මහවැලි අධිකාරියේ iii ශ්‍රේණියේ ලිපිකරු තනතුරට පත්කිරීම.
1984.02.01 දින සිට ඇඹිලිපිටියේ උඩවලව නේවාසික කළමනාකරු වෙත වාර්තා කරන ලෙස දක්වා ඇත.
A 2, A 3 පිළිවෙලින් ලිපිකරු ii හා I ශ්‍රේණි වලට උසස් කිරීමේ ලේඛන වේ.
A 4 පළමු පාර්ශ්වය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කරන ලද පැමිණිල්ල.
A 4 (a) එකී සභාව විසින් අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට අදාළ පළමු පාර්ශ්වයට ලබාදුන් තීන්දුව.
A 5 පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලන සහකාර තනතුරට උසස් කිරීම.
A 6 පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ iii ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුරට උසස් කිරීම.
A 7, A 7 a පළමු පාර්ශ්වය සහකාර අධ්‍යක්ෂක (පිරිස්) තනතුර ඉල්ලීම හා ඊට ලද පිළිතුර
දෙවන පාර්ශ්වය විසින් 2021 පෙබරවාරි 15 වන දිනැති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ස්ථාවරය ගොනු කර ඇත. එහිදී මූලික විරෝධතා

ද ඉදිරිපත් කර ඇත. මූලික විරෝධතාවයන් ලෙස, පළමු පාර්ශ්වය ඒ වන විට විශ්‍රාම ගොස් ඇති අයෙකු නිසා සජීවී කාර්මික ආරාවුලක් පැන නැගී නැති බවත්, ඒ නිසා සමථයක් හෝ ප්‍රදානයක් කිරීමට බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බවත්, පළමු පාර්ශ්වය ඉල්ලුම්කර ඇති සහන සාධාරණ කාලයක් තුල ඉල්ලා නොමැති බවත් දක්වා ඇත.

මෙහිදි බේරුම්කරණයට යොමුකර ඇති මෙම ආරාවුල කම්කරු දෙපාර්තමේන්තුවට යොමුකර ඇත්තේ විශ්‍රාම යාමට පෙර බැව් ලේඛන මගින් සනාථ වේ. එනම් 2016.03.31 දිනදීය. එම පරීක්ෂණ වලින් අනතුරුව ගරු අමාත්‍යතුමාගේ බලතල ප්‍රකාරව කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම්කරණයට යොමු කර ඇත. එම නිසාම බේරුම්කරණ ප්‍රදානයක් ලබා දීමේ බලය මෙන්ම එය බලාත්මක කිරීමේ හැකියාව ද පවතින හෙයින් එම විරෝධතා ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර 2022.03.15 දින විභාගයට තීන්දු කර ඇත.

එමෙන්ම දෙවන පාර්ශ්වයේ 3 වන විරෝධතාවය වන සාධාරණ කාලයක් තුළ ඉල්ලා නොමැති බව යන කරුණ සලකා බැලීමේ දී 2006 වසරේ දී තමාට සිදුවී ඇතැයි කියන අසාධාරණ කරුණු සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ද පැමිණිලි කොට එමගින් ද ඊට අදාළව නිර්දේශ ලබාදී ඇති බැව් ඉදිරිපත් කර ඇත. A 4 හා A 4 a ලේඛන වලින් ඒ බව සනාථ වේ. එම නිර්දේශයන් සම්බන්ධව ද දෙවන පාර්ශ්වය කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති අතර එම කරුණු ම මෙම බේරුම්කරණ ක්‍රියාවලියට යොමුවී ඇති බව පැහැදිලි වේ.

- පළමු පාර්ශ්වය වන එස්.ලියනගේ මිය දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 1984.02.01 සිට iii ශ්‍රේණියේ ස්ථිර ලිපිකාර තනතුරකට පත්වීම් ලබා ඇත. (A1)
- එසේම 1990.01.01 දින සිට එම තනතුරේම ii ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත. (A 2) (90/3/7 ලිපිය)
- එසේම 1997.11.27 දින සිට එම තනතුරේම I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇත. (A 3) (98/4/28 ලිපිය)
- 2009.11.01 සිට බලපැවැත්වෙන පරිදි පෙරදාතම් කර පාලන සහකාර තනතුරට උසස් කිරීම 2011.09.25 දින ලිපියෙන් ලබාදී ඇත. (A 5)
- iii ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුරට උසස්වීම් (2011.04.01 දින සිට) 2011.11.28 දිනැති ලිපියෙන් ලබාදී ඇත. (A 6)
- පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලකට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයට ලක්කර ලබාදී ඇති නිර්දේශ ලිපිය A 4 ලෙස ඉදිරිපත් කර ඇත.

01. පළමු පාර්ශ්වයට සිදුවී ඇති අසාධාරණයන් ලෙස,

I. පුරා වසර 13 ක් පාලන සහකාර තනතුරේ වැඩ බැලීමට පත්කර අවිධිමත් ලෙස තනතුරු කිහිපයක රාජකාරි ඉටු කරවා ගත් බැව් කියා සිටී. (1998 සිට)

II. 2005 වසරේ දී තමාට පාලන සහකාර තනතුර ලබා නොදුන් බවත්,

III. 2008 වසරේ දී පරිපාලන නිලධාරි තනතුර සඳහා අයදුම්කර 2008.03.14 සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූවත් "සුදුසුකම් නැත" ලෙස සටහන් කර එය අහිමි කර ඇති බවත්,

IV. 2010 වර්ෂයේ දී නැවත පරිපාලන නිලධාරි තනතුර සඳහා තරඟ විභාගයට ඉදිරිපත්ව තමා පළමු ස්ථානය ලබාගත්ත ද, ලැයිස්තුවේ 2-16 දක්වා අයට තනතුරු ලබාදුන් බවත් තමාට ලබා නොදුන් බවත්,

V. 2010 වර්ෂයේ දී නැවත පාලන සහකාර තනතුර සඳහා පැවැති තරඟ විභාගයේ දී පළමු ස්ථානය ලබාගත් හෙයින් 2011.01.25 ලිපිය මඟින් 2009.11.01 ට පෙරදාතම් කර පාලන සහකාර තනතුර ලබාදුන්නද (A5) එකී තනතුරේ වැඩ බැලීම හා නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීම මත එම තනතුර 1998.11.04 දින සිට ලබාදිය යුතුව තිබූ බවත්,

VI. ඊට පෙර 2010 වසරේ දී පරිපාලන නිලධාරි තරඟ විභාගයේ පළමු ස්ථානය ලබාගත්ත ද තනතුර ලබානොදීම සම්බන්ධව කළ අභියාචනා මත 2011.04.01 දින සිට තනතුරේ පිහිටුවා 2011.11.28 ලිපිය මගින් iii ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුරට පත්කළ ද ජ්‍යෙෂ්ඨත්වය අහිමිවීම මත අගතියක් සිදුවී ඇති බවත් කියා සිටී.

VII. 2012 වසරේ දී සහකාර අධ්‍යක්ෂක පාලන තනතුර පුරප්පාඩුවට ද තමාට වඩා අඩු සුදුසුකම් ලද්දකු පත්කර තමාට අගතියක් සිදුකර ඇති බවත්, වැඩිදුරටත් කියා සිටී.

02. ඉහත කී අසාධාරණයන් සම්බන්ධයෙන් දීර්ඝව පැවැති නඩු විභාගයේ දී

I. පළමු කරුණ ලෙස දක්වා ඇති වැඩ බැලීමේ තනතුර වසර 13 ක් සිදුකල බවට කියා සිටිය ද එය සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් වී නොමැත. වැඩ බැලීමට අදාළව 1998-2000 දක්වා ගෙවීම් කර ඇති බැව් පළමු පාර්ශ්වය පිළිගනී. අවසන් වරට ඒ සම්බන්ධව ඉල්ලීමක් යොමු වී ඇත්තේ 2006 දි ය. එය XI ලෙස ඉදිරිපත් කර ඇත්තේ තනතුර ස්ථිර කිරීමක් සඳහාය. එමගින් එම අවස්ථාවේ දී ද ඇය වැඩ බලන පාලන සහකාර රාජකාරි කල බැව් සනාථ වේ. එමෙන්ම පළමු පාර්ශ්වය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉල්ලුම්කර පරීක්ෂණයකින් අනතුරුව 2007.03.20 දිනැතිව ලබාදී ඇති නිර්දේශ (A 4, A 4 a) මෙහිදී අදාළ කර ගැනීම සාධාරණ වේ. මෙහිදී දෙවන පාර්ශ්වය වෙත ලබාදී ඇති එම නිර්දේශයක මෙම වැඩ බලන දීමනාව ගෙවීම සම්බන්ධව කරුණු දක්වා ඇත. නමුත් ගෙවීම් කලයුතු නිසි කාල සීමාවක් තීරණය කොට නොමැත.

II. ඉහත කී 2007.03.20 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා දී තිබුණ ද 2005 සිට පාලන සහකාර තනතුර ලබාදීම සම්බන්ධව පැහැදිලි හෝ සාධාරණ සාක්ෂියකින් සනාථ වී නොමැත.

III. 2008 වසරේ පරිපාලන නිලධාරි තනතුරේ සම්මුඛ පරීක්ෂණ තීරණය වන පළමු පාර්ශ්වයට ‘‘සුදුසුකම් නැත’’ යන්න පිළිබඳව තීරණයක් ගැනීම සඳහා බේරුම්කරණයට හැකියාවක් නොමැත. එම පරීක්ෂණ මණ්ඩල තීරණය පිළිබඳව ඒ අවස්ථාවේ පියවර ගැනීම පළමු පාර්ශ්වය ආයතනය සමඟ සිදුකල යුතුව තිබූ තත්වයකි.

IV. 2010 වර්ෂයේ සිදුවීමක සත්‍ය අසත්‍යභාවය සෙවීම හෝ ඒ පිළිබඳව බේරුම්කරණ අවස්ථාවේ විමසීම නීත්‍යානුකූල නොවේ. එමෙන්ම ඒ සම්බන්ධව සනාථ කිරීමට හෝ විමසීමකට හෝ පළමු පාර්ශ්වය උත්සුක වී නොමැති බවද පෙනේ.

V. 2009.11.01 ට පෙරදාතම් කර ලබා දුන් පාලන සහකාර තනතුර එකී තනතුරේ වැඩ බැලීම නිසා හෝ / හා නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීම මත හෝ 1998.11.04 ට පෙරදාතම් කිරීම කලයුතු බවට සාධාරණ ස්වාධීන සාක්ෂියක් ඉදිරිපත් නොවේ. එබැවින් එය එසේ කළ යුතුබවට තීන්දු කිරීමද සාධාරණ නොවේ.

VI. 2011.04.01 දින සිට පරිපාලන නිලධාරී iii ශ්‍රේණිය ලබාදී ඇත. අනතුරුව 1 වන ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුරට 2013.06.12 දින නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අන්තර්ග්‍රහනය කර ඇත. මේ තත්වය (R 28) (2022.04.04 හරස් ප්‍රශ්න 318 පිටුව) පළමු පාර්ශ්වය කිසිදු අවස්ථාවක ඉදිරිපත් කර නැත.

VII. 2012 වර්ෂයේ දී සහකාර අධ්‍යක්ෂක පාලන තනතුරට තමාට වඩා අඩු සුදුසුකම් ලත් අයෙක් පත්කිරීම සම්බන්ධව ප්‍රමාණවත් සාක්ෂි මෙන්ම සනාථ කිරීමක් විභාගයේ දී ඉදිරිපත් නොවුනි.

නිගමනය :

පළමු පාර්ශ්වය ආරාවුලට හේතු වූ කරුණු ලෙස ඉල්ලුම් කරනුයේ තමාට මුළු වෘත්තීය ජීවිතයේම සිදුවූවා යැයි කියන අසාධාරණකම් මතින්, තමන්ට අහිමි වූ තනතුරු ද ඊට අදාළ මූල්‍යමය ප්‍රතිලාභ හා ඉන් තමාට සිදුවූ මානසික බලපෑමට සහනයන් ය. මෙහිදී පළමු පාර්ශ්වය ඉදිරිපත් කළ සාක්ෂි හා ලේඛන පරීක්ෂාවේදී තමාට පාලන සහකාර තනතුර ස්ථිරව ලබා නොදී වැඩ බලන පාලන සහකාර ලෙස වසර 13 ක් සේවය ලබාගෙන තමාට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු අධ්‍යාපන සුදුසුකම් වලින් අඩු හා වෘත්තීය සුදුසුකම් අඩු අයට 2002 වර්ෂයේ තනතුරු ලබාදී ඇති බැව් කියා සිටියද, ඒවා සනාථ කිරීමට ලේඛන හෝ පිළිගත හැකි මට්ටමේ සාක්ෂි ඉදිරිපත් වී

නොමැත. එමෙන්ම යම් තනතුරක වැඩ බැලූ පමණින්ම එම තනතුරේ ස්ථිර තනතුරු ලබාදීම සිදුකල යුතුයැයි ස්ථාවරයක් නොමැති අතර 2005 වර්ෂයේ දී ත් තමාට එම තනතුර ලබා නොදුන් බැව් කියා සිටියද එය ද කිසිදු විටක පිළිගත හැකි ස්ථාවරයකින් ඉදිරිපත් කර නැත. 2008 වර්ෂයේ දී පරිපාලන නිලධාරි තනතුරට තමාව සුදුසුකම් නැත කියා සටහන් කර තිබීම සාධාරණ නොවන බැව් කියා සිටිය ද, එහිදි පළමු පාර්ශ්වයේ උපාධි සහතිකය ඉදිරිපත් නොවූ බැව් සාක්ෂි විග්‍රහයේ දී සනාථ වේ. එය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් නිකුත් කර ඇත්තේ 2008.03.27 දින බවත් පරීක්ෂණය පැවැතියේ 2008.03.14 බවත්, සහතිකය බලාත්මක දිනය 2007 වර්ෂය වුවද පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් නොවී තිබීම ඊට හේතු පාදක වී ඇති බවත් පෙනේ.

කෙසේ වුවද ආයතනයෙන් සිදුවූ අසාධාරණ තත්වයක් හෝ ක්‍රියාවලියේ හේතු වූ කරුණක් මත හෝ 2010 වසරේ තරග විභාගයේ ප්‍රතිඵල මත පළමු පාර්ශ්වයට 1998.11.04 දිනට පෙරදාතම කර පාලන සහකාර තනතුර ලබාදී ඇත. අනතුරුව පරිපාලන නිලධාරි iii ශ්‍රේණියද, ඉන්පසු පරිපාලන නිලධාරි I ශ්‍රේණියට උසස්වීම් ලබා දී ඇත. 2012 වර්ෂයේ සහකාර අධ්‍යක්ෂක පාලන තනතුර පුරප්පාඩු වූ බවද, අඩු සුදුසුකම් ඇති අයෙකු පත්කළ බැව් පළමු පක්ෂය ප්‍රකාශ කර ඇතත් ද එම කරුණු සනාථ කිරීමට කටයුතු කර නොමැත. 2014 වර්ෂයේ දී ද සහකාර අධ්‍යක්ෂක පිරිස් තනතුර පුරප්පාඩු වූ අවස්ථාවේ දී ඉල්ලුම් කල ද ප්‍රතික්ෂේප කලා ද යන ස්ථාවරය සනාථ කර නැත. 2015 දී සහකාර අධ්‍යක්ෂක (පාලන) තනතුර සම්බන්ධව උපරිම සුදුසුකම් තිබූ පළමු පාර්ශ්වය ඊට අයදුම්කල ද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම තමා 2016 විශ්‍රාම යන තුරු නොපවත්වා සිටි බැව් කියා සිටී. එසේම පළමු පාර්ශ්වය 2013 සිට 2016 දක්වා සේවය ලබාදී ඇත්තේ විශේෂ සේවා දීර්ඝ කිරීමක් තුළදී ය. එනම් 2013-2016 දක්වා අවු: 57 න් ඔබ්බට සේවය ආයතනික විශේෂ වරප්‍රසාද මත ලබාදී ඇත. බොහෝ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පෞද්ගලික ආයතනයන් හි සේවා දිගුවන් ලබා දී ඇති අවස්ථාවල උසස්වීම් ලබාදීම සිදුකරනු නොලබයි. නමුත් එම තත්වය එසේ ද යන්න දෙවන පාර්ශ්වය සනාථ කිරීමක් ද සිදුකර නැත. එසේම 2013.08.01 දිනැති R - 23 ලිපියෙන් පළමු පාර්ශ්වයේ ඉල්ලීම් සම්බන්ධව ලිඛිත ප්‍රතිචාරයක් ලබාදී ඇත.

එසේම පරිපාලන නිලධාරි III ශ්‍රේණියට 2011.04.01 දින සිට උසස්වීම් ලද පළමු පාර්ශ්වය, 1990 බඳවා ගැනීමේ පරිපාටිය හා 2013 බඳවා ගැනීමේ පරිපාටිය අතර සිදුවී තිබූ නියමිත කාල වකවානු වෙනස්වීම් මත පරිපාලන නිලධාරි I ශ්‍රේණියට උසස්වීම් 2013 වර්ෂයේ දීම ලබාදී ඇත. එය II ශ්‍රේණියේ නොපිහිටුවා කෙලින්ම I ශ්‍රේණියම ලබාදීම ආයතනික පාර්ශ්වය ලබාදී ඇති සුවිශේෂී සාධාරණ තත්වයක් සේ පෙනේ.

කෙසේ වුවද දෙපාර්ශ්වයේම කරුණු සලකා බැලීමේ දී පළමු පාර්ශ්වය තම ඉල්ලීම් කෙසේ හෝ ඉටුකර ගැනීමට උත්සහ දරමින් ද, දෙවන පාර්ශ්වය බොහෝ අවස්ථාවල තම පාර්ශ්වය නිවැරදි බව ඒත්තු ගැන්වීමට සාක්ෂි මෙහෙයවමින් ද කරුණු ඉදිරිපත් කොට ඇත. තවද මෙම ගැටළු සහගත තත්වය වර්ෂ 1984 න් පටන් ගෙන 2016 දක්වා කාලීනව උද්ගතව තිබූ අතර ඒ ඒ කාලවල අවශ්‍ය පියවර නොගැනීම මත ගැටළු දීර්ඝ කාලීනව ඉතිරිව ඇති බැව් පෙනේ. කෙසේ වුවද දෙපාර්ශ්වයෙන් ඉදිරිපත්ව ඇති කරුණු හා ලේඛන පිරික්සීම තුලින් පහත ප්‍රදානයට යොමු වීම සාධාරණ බැව් තීරණය කරමි.

ප්‍රදානය :

I. පළමු පාර්ශ්වය විසින් ලිපිකරු II ශ්‍රේණිය/ ලිපිකරු I ශ්‍රේණිය/ පාලන සහකාර හා පරිපාලන නිලධාරි තනතුර පෙරදාතම් කිරීම ඉහත කී කරුණු මත සාධාරණ හා යුක්ති සහගත නොවන බැව් තීරණය කරමි.

II. එමෙන්ම සහකාර අධ්‍යක්ෂක පිරිස්/පාලන, අධ්‍යක්ෂක පිරිස් යන තනතුරු වල පිහිටුවීම හා හිඟ වැටුප් ලබාදීම ඉදිරිපත්ව ඇති කරුණු හා ගතව ඇති කාලය සමඟ සාධාරණ හා යුක්ති සහගත නොවන බැව් තීරණය කරමි.

III. පළමු පාර්ශ්වය ඉදිරිපත් කර ඇති තනතුරු වල පිහිටුවා හිඟ වැටුප් ගණනයන් පිළිබඳ අවිනිශ්චිත තත්වයක් පවතී. තනතුරු පසුදාතම කිරීමක් සිදු නොවන බැවින් එම ගණනයන් මත පිහිටා හිඟ ලබාදීම සාධාරණ හා යුක්ති සහගත නොවේ. එමෙන්ම එම ඉදිරිපත් කර ඇති හිඟ ගණනයන් සනාථ කිරීම හෝ පැහැදිලි කිරීමක් ද ඉදිරිපත්ව නැත. පිටු අංක 494/495 (X (I), X (II)

IV. එසේ වුවද බේරුම්කරණයෙන් ලබාදුන් නියෝග හා උපදෙස් පරිදි නිවැරදි වැටුප් තලයන් හි පිහිටුවීම් පිරික්සා හිඟ තිබේ නම් ඉදිරිපත් කරන ලෙසට දුන් තීරණය පරිදි 2024.09.13 දින ඉදිරිපත් කර ඇති ඇමුණුම 1 හි සඳහන් වැටුප් තලයන් හි නිවැරදි ලෙස පිහිටුවා ඉදිරිපත් කර ඇති හිඟ ගණනයන් දෙවන පාර්ශ්වය සත්භාවයෙන් සිදුකර ඇති බැව් පිළිගනී. එම හිඟ ලේඛනයේ ගිණුම් නිලධාරි සනාථ කොට අධ්‍යක්ෂක මුදල් අනුමත කර සහතික කොට ඇත. එහි සඳහන් හිඟ වැටුප රු. 423,716.68 කි. එකී මුදල පළමු පාර්ශ්වයට ලබාගැනීමට හැකිවන පරිදි ගෙවීමට දෙවන පාර්ශ්වයට නියම කරමි.

V. එසේම පළමු පාර්ශ්වය වැඩ බලන පාලන සහකාර ලෙස සේවය කල 1998.11.04 සිට 2000.12.31 දක්වා වැඩ බැලීමේ දීමනාවක් ගෙවා ඇත. නමුත් පළමු පාර්ශ්වය වසර 13 ක් වැඩ බැලීමේ රාජකාරි ඉටුකල බැව් පැවසුවද එය සනාථ නොවේ. 2006 වසරේ අවසන් ඉල්ලීම යොමු වී ඇති බැව් X 1 පිටු අංක 87 න් (2006.06.09) සනාථ වේ. එමෙන්ම 2003.03.10 දිනැති X 3 පිටු අංක 85 ලිපියෙන් වැඩ බැලීමේ දීමනාව 2001.01.01 සිට නවතා ඇති බැව් ද සනාථ වේ. එම දීමනාව සම්බන්ධවද නිසි මුදලක් සනාථ නොවේ. A 7ලෙස සලකුණු කර ඇති (පිටු අංක 78) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ලබාදී ඇති නිර්දේශයන්හි එය රු. 1765/- ලෙසත් සඳහන් වේ. එම මුදල මත පිහිටා පහත පරිදි වැඩ බැලීමේ දීමනාව ගණනය කරමි.

2001 වසරේ සිට 2006.06.09 දක්වා පමණි.

| | | | | |
|---|---|---|---|---|
| 2001 මාස 12 | - 1765 x 12 | = | රු. | 21180.00 |
| 2002 මාස 12 | - 1765 x 12 | = | රු. | 21180.00 |
| 2003 මාස 12 | - 1765 x 12 | = | රු. | 21180.00 |
| 2004 මාස 12 | - 1765 x 12 | = | රු. | 21180.00 |
| 2005 මාස 12 | - 1765 x 12 | = | රු. | 21180.00 |
| 2006 මාස 05 | - 1765 x 5 | = | රු. | 8825.00 |
| | | | රු. | 114,725.00 |

ඉහත රු. 114,725.00 ක මුදල වැඩ බැලීමේ දීමනාව ලෙස 2001/1 සිට 2006/5 දක්වා ගෙවීම සාධාරණ හා යුක්ති සහගත ලෙස තීරණය කරමි.

| | | |
|---|---|---|
| ඒ අනුව මුළු මුදල | රු. | 423,716.68 |
| | රු. | 114,725.00 |
| | රු. | 538,441.68 |

රු. 538,441.68 (පන්ලක්ෂ තිස්අට දහස් හාරසිය හතලිස් එකයි ශත හැට අට) ක මුදල පළමු පාර්ශ්වයට ලබා ගැනීමට හැකිවන පරිදි මෙම ප්‍රදානය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීමටත්, එම මුදල උපයාගත් වැටුපක් බැවින් ඒ සඳහා සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් හා පාරිතෝෂික හිඟ ඇත්නම් ගෙවීමට පියවර ගැනීම සහකාර කම්කරු කොමසාරිස් මැද කොළඹ විසින් ඉටු කල යුතු බවටත් තීරණය කරමි.

ඉහත තීන්දුව සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

වී. ජයරත්න
බේරුම්කරු
2026.01.08

EOG 03 - 0136